ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව 4 වන මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II - 2023/2024
LLU4611 - ඉඩම් නීතිය
කාලය - පැය එක (01) යි.

---

දිනය - 2024.12.15 වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.10.30 දක්වා

---

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.
අපේක්ෂකයින්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. සිය පුත්‍රයා වන නිමල්ගේ විවාහය නිමිත්තෙන් තමාට අයත් 'සැනසුම' නම් දේපල ඔහුට පැවරීමට නිර්මලා අදහස් කලාය. 2023 වසරේදී විවාහ වූ නිමල් සිය බිරිද සමග 'සැනසුමෙහි' භුක්තියට ඇතුළුවූයේය. කෙසේ වුවද එකී දේපල නිමල්ට නෛතිකව නොපවරන ලදී. නිර්මලාගේ චේතනාව කුමක්දැයි දැනසිටි නිමල් 2024 ජනවාරි මසදී දේපල සිය බිරිදගේ උපන්දිනයේදී ඇයට තෑගි කළේය. මෙම තෑගි ඔප්පුව ලියාපදිංචි නොකරන ලදී. හදිසි මුදල් අවශ්‍යතාවයකින් සිටි නිමල් මෙම දේපල 2024 ජුනි මසදී මංජුලට විකුණුවේය. මෙම ඔප්පුව 2024 අගෝස්තු මස ලියාපදිංචි කරන ලද අතර, නිමල් හා ඔහුගේ බිරිද භුක්තියෙහි දිගටම රැදී සිටියහ.

ඉහත දෙන ලද සිද්ධිමය කරුණු මත හිමිකම් සාධන පත්‍ර ලියාපදිංචි කිරීම සහ 'පූර්වතාවය' නැමති සංකල්පය පිළිබඳව ශ්‍රී ලංකා නීතිය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

ඔබගේ පිළිතුර අදාල ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු තීරණ ඇසුරෙන් පහදන්න.
(ලකුණු 20)

02. (අ) ඉඩම් නීතියෙහි එන හවුල් අයිති කරුවන් සතු අයිතිවාසිකම් සාකච්ඡා කරන්න.
(ලකුණු 15)

(ආ) හවුල් අයිතිකාරීත්වය අවසන් කළ හැකි ක්‍රම හදුනා ගන්න. (ලකුණු 05)

අදාල නඩු තීරණ දක්වමින් ඔබගේ පිළිතුරට සහය දක්වන්න.

-සියළුම හිමිකම් ඇවිරිණි.-